
# 15 ලොව අවදි කළ හෙළ පුතණුවෝ

ජාතික චින්තනය හා අනන්‍යතාව ඔප් නංවමින්, දේශ වාත්සල්‍යය හා ආගමික හැඟීම් පුබුදුවමින්, විවිධ සත් කාර්යයන් ක්‍රියාත්මක කරමින් සමාජයේ නවෝදයක් ඇති කිරීමට දිවා රෑ වෙහෙස දරා දේශ හා දේශාන්තර කීර්තියට පාත්‍ර වූ අනගාරික ධර්මපාලතුමා පිළිබඳ තොරතුරු මෙම පාඩමෙන් ඉදිරිපත් කෙරේ.



**"වරද දුටු තැන පෙන්වා දීම මගේ ගතියයි. මා කරන අවවාද පිළිගැනීමට අසතුටු නම් ඒ බව දැන්වූ විට ලංකාව අත්හැර වෙන රටකට ගොස් විසීමට මට පුළුවන."**

**"මිනිසුන් විඳින දුක් හිරිහැර ගැන හිතුවා ම මට උහුලන්ට බැරි තරම් සිත් වේදනාවක් ඇති විය. දුප්පත් අයට හැකි උපකාරයක් කරන්නට මම නිතර සූදනමින් සිටිමි."**

අභීත වාග් විලාසයෙන් ලක් දෙරණ අවදි කළ අනගාරික ධර්මපාලතුමාගේ අගනා ප්‍රකාශයි මේ. එමගින් මානව වර්ගයා පිළිබඳ ව එතුමා දැක්වූ ධනාත්මක ආකල්ප මැනවින් පිළිබිඹු වේ. තමන් උපන් දේශයට පමණක් සීමා නොවී අපමණ දුක් ගැහැට විඳිමින් දේශ දේශාන්තරයන්හි සංචාරය කොට බුදු දහම මෙන් ම යහපත් ගුණ ධර්ම පිළිබඳව ද එතුමා තම නිවහල් අදහස් ප්‍රකාශ කළේ ය. අප රටේ ජාතික නායකයෙකු වශයෙන් මෙතුමා කළ සේවය අමිල ය.

අදීන නායකත්වයක් නොමැතිකම නිසා ශ්‍රී ලංකා ඉතිහාසයේ අඳුරු යුගයක් වූ 19 වන සියවසේ බෞද්ධ කටයුතු සියල්ල අවුල්වියවුල් සහගත තත්ත්වයක පැවතිණි. නොයෙක් ජාතික ආගමික මතභේද නිසා දේශීය ජනතාව භේදභින්න වී සිටියෝ ය. සිංහලයෝ ස්වකීය ජන්මභූමියෙහි ම විදේශීය ජනතාවක් බවට පත් ව සිටියහ. මේ වන විට තම ජනතාවගේ ශෝකජනක තත්ත්වය පාලක පක්ෂයට ඉදිරිපත් කිරීමට එඩිතර සිතක් ඇති අයෙක් නො වූහ. රටත්, ජාතියත්, ආගමත් පිරිහෙන හැටි හද පිරුණු ශෝකයෙන්, නෙත පිරුණු කඳුළෙන් යුතු ව මෙතුමා ඉවසිලිමත් ව බලා සිටියේ බොදු ජනයා පිබිදවීමට සුදුසු අවස්ථාව එළඹෙන තෙක් ය. අන්‍යයන්ගේ යහපත පිණිස තම දිවිය කැප කිරීම සඳහා එතුමා සිය දෙගුරුන්ගේ අවසරය ඉල්ලා සිටියේ මෙසේ ය.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

*දයාබර පියාණන් සහ මෑණියන් වෙතටයි,*

*එක පුද්ගලයෙකුගේ නොව, සියලු ලෝක සත්ත්වයාගේ සැප ප්‍රාර්ථනා කරන මට ඔවුන්ගේ දියුණුවට වැඩ කිරීමට ඉඩ දෙනු මැනවි. ලෞකික සැපයක් ඕනෑ නො කරන නිසාත්, බලාපොරොත්තු නො වන නිසාත් මට යමක් ඕනෑ නො කරයි. ම විසින් දෙහොත් මුදුන් දී ඉල්ලන ඉල්ලීමට බාධා නො පමුණුවා චිත්ත ප්‍රීතියෙන් එය මට දෙන හැටියට මම ඉල්ලමි.*

*ඒ මෙයයි. සම්පූර්ණයෙන් මගේ කාලය බුද්ධාගමේ දියුණුව පිණිස වැඩ කරන්නටයි. මගේ ජීවිකාව ආරක්ෂා කර ගැනුමට මසකට රුපියල් පහක් ලැබෙන්නටත් ඉල්ලමි. මේ ඉල්ලීම ඉෂ්ට කළොත් අප සියල්ලන්ගේ ම නිවන් මාර්ගය ලේසි වේ. ඉන් නිසා බාධා නො පමුණුවා ඉල්ලීම ඉෂ්ට කරනු ලැබේවා.*

*සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් අප බෝධිසත්ත්වයන් වහන්සේ ලෝක සත්ත්වයා නිසා දුක් වින්දා නම්, පුළුවන් පමණක් ලෝක සත්ත්වයාගේ දියුණුවට වැඩ කරන්නට අපට නො හැකි ද?*

*මීට,*
*යටහත් පුත්‍ර,*
*ඩේවිඩ්.*

අනගාරික ධර්මපාලතුමා විසින් දෙමාපියන්ට ලියන ලද ලිපියට අනුව ඔහුගේ ඉල්ලීම ඉටුවුණේ ය. මෙතැන් සිට ලෝක සත්ත්වයාගේ දියුණුව උදෙසා මෙතුමාගේ ජීවිතය කැප වුණේ ය.

1890 වර්ෂයේ දී දඹදිව සිද්ධස්ථාන වැඳ පුද ගැනීමට ගිය මෙතුමා බුද්ධගයා ශුද්ධ භූමිය ශිව භක්තික මහන්තා කෙනෙකු භාරයේ පවතින සැටිත් එහි හින්දු දෙවොලක මෙන් වතාවත් පැවැත්වෙන සැටිත් දැක කම්පාවට පත්විය. කෙසේ හෝ සමස්ත ලෝක බෞද්ධ ජනතාව බේරා ගැනීමට අදිටන් කළ මෙතුමා **"සිංහලයිනි නැගිටිව්, බුද්ධගයාව බේරා ගනිව්"** යන හඬ මුළු ලක්දිව පුරා පතුරුවා හරිමින් ජාතිය පණගැන්වී ය. වර්ෂ 1891 මැයි මස 31 වැනි දින බුද්ධගයා මහා බෝධි සමාගම පිහිටුවමින් හේ දිගු ශාසනික මෙහෙවරක යෙදීමේ මූලික පියවර තැබුවේ ය. සිය අභිමතාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා ක්‍රියා කළ එතුමාගේ අධිෂ්ඨානය සඵල වී බුද්ධගයාව බෞද්ධයින්ට උරුම විය.

වර්ෂ 1893 සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාව නියෝජනය කරමින් චිකාගෝ නුවර පැවැති ජගත් දෘෂ්ටි සම්මේලනයට සහභාගි වූ මෙතුමා ථේරවාදි බුදුසමයේ දක්ෂිණාංශයේ නියෝජිතයා වශයෙන් පෙනී සිට **'බුදුරජාණන් වහන්සේට ලොව ණයගැති වෙයි'** මැයෙන් කළ චතුර දේශනය රටට අන්තර්ජාතික කීර්තියක් අත්කර දීමෙහි ලා සමත් විය. **'දෘෂ්ටි සංගම් ඉතිහාසය'** නමැති පොතේ ඒ බව මැනැවින් සඳහන් වේ. ධර්මපාලතුමාගේ එම කතාව පිළිබඳ ව ඇමරිකාවේ පුවත්පත්වලින් කෙතරම් ප්‍රසිද්ධියක් ලැබුණේ දැ'යි යන්න, ආපසු සිය රටට එන ගමනේ දී හොනලුලු වරායට පැමිණි විට මේ කීර්තිමත් ධර්මදූතයා දැකගැනීම සඳහා විශාල ජනකායක් රැස්ව සිටීමෙන් පැහැදිලි වේ. එහි දී කෝටිපති දානපතිනියක වූ **'මේරි පොස්ටර් රොබින්සන්'** මැතිනිය හඳුනා

ගැනීමට මෙතුමාට අවස්ථාව උදා විය. පසු කලෙක ධර්මපාලතුමා විසින් මෙරට හා ඉන්දියාවේ ආරම්භ කරන ලද ජාතික, ආගමික සේවා සඳහාත් බුද්ධගයාව බේරා ගැනීමේ සටන සඳහාත් ඕ නොමසුරු ව ධනය පරිත්‍යාග කළා ය.

ක්‍රි.ව. 1908 දී බ්‍රිතාන්‍යයේ චාරිකාවක යෙදුණු ධර්මපාලතුමා බුදු දහම පිළිබඳ අවබෝධයක් ලබා දීමට දේශන රැසක් පැවැත්වී ය. දෙස්තර හේවාවිතාරණ මහතා ලන්ඩන් නුවරට යැවූ ධර්මපාලතුමා එහි මහාබෝධි සංගමයේ ශාඛාවක් විවෘත කිරීමට උපදෙස් දුන්නේ ය. ලන්ඩන්හි ග්ලෝස්ටර් මාවතේ තෙමහල් මන්දිරයක් මිල දී ගැනීමට සැලැස්වූ මෙතුමා ලන්ඩනයේ ධර්ම ප්‍රචාරය පිණිස ශ්‍රී ලාංකික ස්වාමීන්වහන්සේලා පිටත් කර යැවී ය. මෙසේ ලන්ඩන් බෞද්ධ විහාරය හා මහා බෝධි සමාගම ද පිහිටුවී ය.

විදේශ භාෂා පිළිබඳ මනා දැනීමක් නොමැති ව ධර්ම ප්‍රචාරක කටයුතු සාර්ථක කර ගැනීම කළ නො හැකි බව ප්‍රත්‍යක්ෂකොට ගත් ධර්මපාලතුමා එම ගැටලුව විසඳා ගැනීමට පියවර ගත්තේ ය. ඒ අනුව සෙංකඩගල පුරවරයෙන් මන්දිරයක් ලබා ගත් එතුමා එහි සාමණේර විද්‍යාලයක් ආරම්භ කර උන්වහන්සේලාට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට කටයුතු කළේ ය. එහි පාලනය මහා බෝධි සමාගමට භාර කළේ ය.

වර්ෂ 1873 දී පැවැති පානදුරා වාදය හේතුකොට ගෙන බෞද්ධ ඉගැන්වීම ලොව පුරා ප්‍රචලිත විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇමරිකානු ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා හා ධනවත් සමාජ සේවිකාවක වූ බ්ලැවැට්ස්කි මැතිනිය විද්‍යෝදය පිරිවෙනේ දී හමුවීම මෙතුමාගේ ජීවිතයට නව ආලෝකයක් ගෙන දීමට සමත් විය. රට පුරා සංචාරය කරමින් ඕල්කට්තුමා ඉංග්‍රීසි භාෂාවෙන් පැවැත්වූ කතා මෙතුමා සිංහලයට නැඟුයේ වැටී ගිය ජාතිකත්වය, මැකී ගිය ආගමික හැඟීම, නැසී ගිය දේශ ප්‍රේමය යළි පණ ගන්වමිනි. එම නිසා මීට පෙර බෞද්ධයන්යැ'යි ප්‍රසිද්ධියේ කීමට ලජ්ජා වූ සිංහලයෝ ආත්මශක්තිය ප්‍රකෘතිමත් කොට නැගී සිටියහ. ඕල්කට්තුමා විසින් **"සත්‍යයට වඩා උසස් ආගමක් නැත"** යන්න පදනම් කරගෙන සමස්ත ලෝක සහෝදරත්වය ගොඩනැගීමේ අදිටනින් පරම විඥානාර්ථ බෞද්ධ සමාගම ආරම්භ කරන ලදි. එහි කොළඹ ශාඛාව මගින් බෞද්ධ දරුවන් උදෙසා පාසල් ආරම්භ කිරීමට ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළේ මෙතුමා ය. කොළඹ ආනන්ද විද්‍යාලය එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇරඹි එක් පාසලකි. ඒ සමග ම වෙනත් පළාත්වල ද ඉංග්‍රීසි බෞද්ධ පාඨශාලා බිහි විය. පළමු වන ඉංග්‍රීසි බෞද්ධ බාලිකා පාසල ද මේ අවධියේ ආරම්භ විය. මෙසේ සමාජ කාර්යයන්හි නිරත ව සිටිය දී රජයෙන් පිරිනැමුණු ලිපිකාර තනතුර මෙතුමා ප්‍රතික්ෂේප කළේ **"මම අධිරාජ්‍යයේ ගැත්තෙක් නොවෙමි"** යි පවසමිනි.

වර්ෂ 1889 දී ඕල්කට්තුමා සමග ජපානයට ධර්ම දූත ගමනක යෙදීමේ භාග්‍යය අනගාරික ධර්මපාලතුමාට හිමි විය. එම ගමනේ දී ෂඩ් වර්ණ බෞද්ධ කොඩිය පළමු වරට ජපානයේ ලෙළ දුනි.

ඉන්දියාවේ පැවැත්වූ ආගමික සමුළුවකට සහභාගි වීමේ අවස්ථාව යළි උදාවීම මෙතුමාගේ ජීවිතයේ විශාල පරිවර්තනයක් ඇති කිරීමට හේතුපාදක විය. එතුමා එතෙක් භාවිත කළ **'දොන් ඩේවිඩ්'** යන නම වෙනුවට **'ධර්මපාල'** යන නම භාවිතයට

ගත්තේ ය. එමෙන් ම බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කිරීමට සිතා ගත් එතුමා අනගාරික ධර්මපාල නමින් ප්‍රසිද්ධියට පත්විය. මෙතුමාගේ මෙම ආදර්ශය හේතු කොට ගෙන විදේශ නම් වෙනුවට සිංහල නම් භාවිතයට සමහරෙක් යොමු වූහ. දේශීය පැරණි සිරිත්විරිත්වලට ගරු කිරීමට සිංහල ජනතාව පිබිදවූයේ ද අනගාරික ධර්මපාලතුමා ය. එතුමා යුරෝපීය ඇඳුම් අතහැර අන්‍යයන්ට පූර්වාදර්ශයක් වී දේශීය ඇඳුමට ජනතාව යොමු කළේ ය. තම මවට ඔසරිය අන්දවා, සාය බොස්තොරොක්ක වෙනුවට ඔසරිය ඇඳීමට සිංහල කාන්තාවන් යොමු කළේ ය.




අනගාරික ධර්මපාලතුමා සංචාරය කළ
රථයේ ඡායාරූපයක්

සත්ත්ව ඝාතනය හා මත්පැන් පානය අතිශයින් පිළිකුල් කළ මෙතුමා දේශන මගින් ද ලිපි ලේඛන මගින් ද ඒවායින් වැළකීමට උපදෙස් දුන්නේ ය. සිංහල බෞද්ධ උරුමය හා අයිතිවාසිකම් රැක ගැනීමට පෙරමුණ ගැනීම නිසා ජනතාව සංවිධානය කොට ඔවුන්ට කරුණු අවබෝධ කරලීමට එතුමා ගම් දනව් පුරා සැරිසැරුවේ ය. එලෙස ගමන් කිරීම සඳහා සකස් කළ '**ශෝභන මාලිගාව**' නමින් හැඳින්වුණු රථයෙහි නැගී දිවයිනේ විවිධ ප්‍රදේශවල සංචාරය කළ එතුමා නිද්‍රෝපගත ව සිටි සිංහල බෞද්ධයන් දේශීය චාරිත්‍රවලට අනුව හැඩගස්වන්නට මහත් වෙහෙසක් දැරී ය. ධර්මපාලතුමා ගෙන ගිය මෙම කාලෝචිත වූ සමාජ සංශෝධන ව්‍යාපාරය නො වන්නට අද අපටයැ යි කිව හැකි සිංහල බෞද්ධ හැදියාවක් දක්නට නො ලැබෙනු ඇත.

ත්‍රිපිටක ධර්මය පිළිබඳ හසළ දැනුමක් ලබා සිටි ධර්මපාලතුමා පුද්ගල අභිවෘද්ධිය ඇති කර ගැනීම පිණිස බුදු දහමේ පිටිවහල ලබාගත හැකි ආකාරය සූත්‍ර පාඨ උපුටා දක්වමින් සිංහලයන්ට පෙන්වා දුන්නේ ය. සමෘද්ධිමත් ආර්ථිකයක් ගොඩනගාගැනීම සඳහා බුද්ධ දේශනාව නො දැනීම සිංහලයන්ගේ කුසීත හා අඥානකමට හේතුව වශයෙන් එතුමා ප්‍රකාශ කළේ ය. බටහිර ශිෂ්ටාචාරය මගින් ලක්දිවට ගෙන එන ලද අධ්‍යාපනය, විද්‍යාව, තාක්ෂණය වැනි ප්‍රයෝජනවත් දෑ තබාගෙන '**බටහිර දූරාචාර**' පමණක් ඉවත් කර දැමිය යුතු බව ධර්මපාලතුමාගේ විශ්වාසය විය.

ලංකාවේ ආර්ථික සංවර්ධනයක් ඇති කිරීමට නම් යුරෝපීය පාලන සමයේ දී විනාශ වී ගිය හා ඒ වන විටත් විනාශ වෙමින් පැවැති දේශීය කර්මාන්ත පුනරුත්ථාපනය කළ යුතු බව ධර්මපාලතුමා ප්‍රත්‍යක්ෂකොට ගත්තේ ය. මේ අනුව බ්‍රිතාන්‍යයෙන් මෙරටට ආනයනය කළ රට රෙදි වෙනුවට දේශීය රෙදිපිළි නිෂ්පාදනයට මාවත සකස් කිරීමට එතුමා පියවර ගත්තේ ය. යූ.ජී. දොලපිහිල්ල මහතා ජපන් රටට යවා අත්යන්ත්‍ර රෙදි විවීම පිළිබඳ පුහුණුවක් ලබා දුන්නේ ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් හේවාවිතාරණ අත්යන්ත්‍ර පේෂකර්ම පුහුණු මධ්‍යස්ථානය ආරම්භ කළේ ය. ඉන් පසුව ද සිංහල තරුණයන් කිහිපදෙනෙකු ජපන් රටට යවා ඔවුනට රෙදි විවීම, රෙදි සායම් කිරීම, කඩදසි මල් සෑදීම හා ගිනිකූරු සෑදීමේ කර්මාන්ත පුහුණුවට අවස්ථාව ලබා දුන්නේ ය.

රටක ආර්ථිකයේ විශේෂ ස්ථානයක් වෙළෙඳාමට හිමි වන බව ධර්මපාලතුමාගේ අදහස විය. එබැවින් පාසලේදීත්, නිවසේදීත් දරුවන්ට වෙළෙඳාම පිළිබඳ ශිල්ප ශාස්ත්‍ර ඉගැන්විය යුතු බව එතුමා පැවසී ය. එවිට තුරුණු වියේ දී ම ධාර්මික ව ධනය ඉපයීමට අවශ්‍ය ඥානය ඔවුනට හිමි වන බව ද විශ්වාස කළේ ය.

බටහිර වෛද්‍ය ක්‍රමය මෙරටට හඳුන්වා දුන් ඉංග්‍රීසීහු දේශීය ආයුර්වේද ක්‍රමය විනාශ වී යන තත්ත්වයට පත්කළහ. එම නිසා දේශීය වෛද්‍ය ක්‍රමය රැකගැනීමට පෙරමුණ ගත් ධර්මපාලතුමා කොළඹ ආයුර්වේද රෝහලක් පිහිටුවා අභ්‍යන්තර හා බාහිර රෝගීන් සඳහා එහි පහසුකම් සැලැස්වී ය.

එතුමා තුරුණු වියේ දී ම මාධ්‍යයට සම්බන්ධ වූයේ '**සරසවි සඳරැස**' පුවත්පත හරහා ය. එකල එම පුවත්පතෙහි මාධ්‍යවේදීන් වශයෙන් ක්‍රියා කළේ කිහිපදෙනෙකු පමණි. එම නිසා ධර්මපාලතුමා සරසවි සඳරැසට ලේඛකයෙකු ලෙස පමණක් නොව මුද්‍රණය කිරීම හා බෙදහැරීම සඳහා දයකත්වය ද ලබා දුන්නේ ය. මුද්‍රණය කළ පුවත්පත් නැමුවේත්, මුද්දර ගැසුවේත්, ලිපිනය ලියා සියල්ල බැඳ සියතින් ම ඔසවාගෙන ගොස් තැපැලට භාර දුන්නේත් මෙතුමා ය. මේ පුවත්පතෙහි අතිරේකයක් ලෙස 'ද බුඩිස්ට්' නම් ඉංග්‍රීසි පුවත්පත ආරම්භ කළ ධර්මපාලතුමා ඒ පිළිබඳ ව මෙසේ සඳහන් කරයි.


***"ලංකාවේ බෞද්ධයන්ට සතිපතා ප්‍රකාශනයක් ආරම්භ කිරීමට කාලය පැමිණ ඇතැ'යි මම කල්පනා කළෙමි. මම මගේ මිතුරන්ගෙන් රුපියල් දහය බැගින් එවන ලෙස ඉල්ලා සිටියෙමි. රුපියල් තුන්සියයක් එකතු වූ විට මම මදුරාසියෙන් ඉංග්‍රීසි අකුරු ගෙන්වාගෙන 'ද බුඩිස්ට්' ආරම්භ කළෙමි."***

මෙය සැබෑ මාධ්‍යවේදියෙකුගේ පූර්වාදර්ශයක් බව කිව හැකි ය. එතුමාගේ මාධ්‍ය දිවියේ වැදගත් සන්ධිස්ථානයක් වූයේ වර්ෂ 1906 දී '**සිංහල බෞද්ධයා**' පත්‍රය ආරම්භ කිරීමයි. එම පුවත්පත ආරම්භ කිරීම සඳහා එතුමා විසින් '**මහා බෝධි යන්ත්‍රාලය**' පිහිටුවනු ලැබී ය. එසේ ම '**දූනගත යුතු කරුණු**' නමැති ලිපි පෙළින් රට ජාතිය ගොඩ නගන්නට එතුමා තුළ පැවැති අභිලාෂය කදිමට පැහැදිලි වේ. ජාතිය හා ලොව අවදි කිරීමට නො නැවතී කටයුතු කළ ධර්මපාලතුමා '**මහා බෝධි පණිවිඩය**' ලොව පුරා ප්‍රචලිත කිරීම සඳහා '**මහා බෝධි සඟරාව**' හා '**බ්‍රිතාන්‍ය බෞද්ධයා**' යන සඟරා ලන්ඩනයේ දී ආරම්භ කළේ ය. ධර්මපාලතුමා ගෙන ගිය ධර්ම ප්‍රචාරක කටයුතු මෙරටින් ඔබ්බට ද පැතිරී ගියේ මෙකී පුළුල් සන්නිවේදන ජාලයේ සංකීර්ණභාවය හේතුකොට ගෙනයි.

දක්ෂ ලේඛකයෙකු, දේශකයෙකු හා දර්ශනවාදියෙකු වූ ධර්මපාලතුමා යුරෝපීය රටවල දේශන පවත්වද්දී බයිබලය රැගෙන යාමට අමතක නො කෙළේ ය. බුද්ධගයාව පිළිබඳ කතා කරන විට බයිබලයේ සමහර පාඨ ද උපුටා දක්වමින් කතා කිරීම එතුමාගේ සිරිත විය. එම නිසා මෙම දේශකයාගේ දේශන ශ්‍රාවකයන්ගේ බුද්ධිය සමග කළ සන්නිවේදනයක් බඳු විය.

වර්ෂ 1864 සැප්තැම්බර් මස 17 වැනි දින උපත ලැබූ මෙම ශ්‍රේෂ්ඨ ලංකා පුත්‍රයාගේ මුල් නම වූයේ දොන් ඩේවිඩ් හේවාවිතාරණ ය. දෙමව්පියන් වූයේ දොන් කරෝලිස් හේවාවිතාරණ මහතා හා මල්ලිකා හේවාවිතාරණ මැතිනියයි. මෙතුමා අධ්‍යාපනය ලැබූයේ දෙමටගොඩ බැප්ටිස්ට්, කොළඹ ශාන්ත බෙනඩික්, කෝට්ටේ ක්‍රිස්තියානි හා ගල්කිස්ස ශාන්ත තෝමස් යන විදුහල්වලිනි.

මුළු ජීවිත කාලය ම ජාතික හා ආගමික සේවය සඳහා කැප කළ මෙම යුග පුරුෂයා වර්ෂ 1931 දී මවුබිමෙන් සමුගෙන ඉන්දියාවට ගොස් බරණැස ඉසිපතනයේ ආරම්භ කරන ලද මූලගන්ධකුටි විහාරයේ දී '**සිරි දේවමිත්ත ධර්මපාල**' නමින් පැවිදි බිමට ඇතුළත් විය. පැවිදි වීමෙන් දෙමසකට පසු ව උපසම්පදාව ලැබූ උන්වහන්සේ වර්ෂ 1933 අප්‍රේල් මස 29 වෙනි දින **"සම්බුදු සසුන පතළ කරනු පිණිස යළි යළිත් උපදිම්"** යි පතමින් සිහිනුවණින් යුතු ව අවසන් හුස්ම හෙළූහ. මෙතුමා අවංක ජන නායකයෙකි. බුදු දහම ලක්දිව හා ලෝකයේ ව්‍යාප්ත කිරීමට කටයුතු කළ ශ්‍රේෂ්ඨ ධර්ම දූතයෙකි. අධිරාජ්‍යවාදීන් ඉදිරියේ නොබිය ව ක්‍රියා කළ නිර්භීත ලාංකිකයෙකි. ලොවට මෙසේ විශාල සේවයක් කළ අනගාරික ධර්මපාලතුමාගේ නාමය සදා අමරණීය වේ.


අනගාරික ධර්මපාලතුමා පැවිදි බිමට ඇතුළත් වූ පසු

අරුත් පැහැදිලි කිරීම්

| | | |
|---|---|---|
| **අභිලාෂය** | - | **කැමැත්ත** |
| **අභිමතාර්ථය** | - | **බලාපොරොත්තුව** |
| **අභිවෘද්ධිය** | - | **දියුණුව** |
| **කුසීත** | - | **කම්මැළි** |
| **දේශ වාත්සල්‍යය** | - | **දේශයට දක්වන ඇල්ම** |
| **පිටිවහල** | - | **උදව්ව/උපකාර** |
| **පුනරුත්ථාපනය** | - | **යළි නැගිටවීම / නැවත ගොඩනැඟීම** |
| **ප්‍රත්‍යක්ෂ** | - | **යමක් අත්දැකීමෙන් අවබෝධ කර ගැනීම** |
| **වාග් විලාසය** | - | **කතා කරන විලාසය / වචන හසුරුවන ආකාරය** |
| **ෂඩ් වර්ණ** | - | **පාට හය (නීල, පීත, ලෝහිත, ඕදාත, මාඤ්ජිෂ්ඨ හා ප්‍රභාස්වර)** |
| **සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක්** | - | **අසංඛ්‍ය කල්ප ලක්ෂ හතරක්, අසංඛ්‍ය කල්පය ගණන් කළ නො හැකි ඉතා දීර්ඝ කාලයකි.** |

## ක්‍රියාකාරකම 01

මේ පාඩම නිශ්ශබ්ද ව කියවන්න.

## ක්‍රියාකාරකම 02

(i) අනගාරික ධර්මපාලතුමා ජීවත් වූ යුගයේ ශ්‍රී ලංකාවේ පැවැති සමාජ තත්ත්වය පැහැදිලි කරන්න.

(ii) 'ඩේවිඩ්' තම දෙමාපියන්ට ලියන ලද ලිපිය මගින් ඔබට ගත හැකි ආදර්ශ දෙකක් ලියන්න.

(iii) එතුමා ගෙනගිය වැඩ පිළිවෙළ සඳහා සහාය දක්වූවෝ කවරහු ද?

(iv) අනගාරික ධර්මපාලතුමා දේශ හිතෛෂී පුද්ගලයෙකු බව තහවුරු කෙරෙන කරුණු මොනවා ද?

(v) ධර්මපාලතුමාගේ චරිතාපදානය තුළින් ඉස්මතු වී පෙනෙන උසස් පුද්ගල ගුණාංග මොනවාද' යි පැහැදිලි කරන්න.

(vi) **'බුද්ධිමත්භාවය, නො පසුබට උත්සාහය හා අධිෂ්ඨාන ශක්තිය නිසා කෙනෙකු සමාජයේ ඉහළ ම තත්ත්වයට පැමිණ සමාජ සේවයට යොමු විය හැකි ය.'** මේ කියමන තහවුරු කිරීමට ධර්මපාල චරිතාපදනයෙන් ගත හැකි සාධක මොනවාද' යි පැහැදිලි කරන්න.

(vii) එතුමා කළ සේවය පහත දක්වෙන වගුවේ සටහන් කරන්න.

| බුදු දහමට | අධ්‍යාපනයට | සමාජයට | මාධ්‍යයට |
|---|---|---|---|
| | | | |

## ක්‍රියාකාරකම 03

(i) මෙම පාඩමෙහි සඳහන් නො වූ ධර්මපාලතුමා ප්‍රකාශ කළ ශ්‍රේෂ්ඨ කියමන් සොයා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

(ii) පන්තිය කණ්ඩායම් කිහිපයකට බෙදී අනගාරික ධර්මපාලතුමාගේ සේවයේ විවිධාංග පිළිබඳ ලිපි හෝ කවි, කතුවැකි, ආදර්ශ පාඨ හා එතුමාගේ ඡායාරූපය ඇතුළත් කරමින් බිත්ති පුවත්පතක් පිළියෙල කරන්න.


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

(iii) සැප්තැම්බර් මස 17 වැනි දිනට යෙදෙන **'අනගාරික ධර්මපාල'** ගුණානුස්මරණ දිනය නිමිත්තෙන් එතුමාගේ සේවය පිළිබඳ සංවාදයක් පවත්වන්න.

(iv) පාසල් මාසික රැස්වීමේ දී ඔබේ පන්තිය නියෝජනය කරමින් **'ලොව අවදි කළ හෙළ පුතණුවෝ'** මැයෙන් කතාවක් පවත්වන්න.

## ක්‍රියාකාරකම 04

පන්තිය කණ්ඩායම් හයකට සංවිධානය වෙන්න. ඔබ කණ්ඩායමට ලැබෙන අකුර හෝ අකුරුවලට අදාළ වචන පාඩම තුළින් සොයන්න.

1 කණ්ඩායම - තාලුජ **'ශ'** යෙදුණු වචන 10ක් සොයා ඉදිරිපත් කරන්න.
2 කණ්ඩායම - මූර්ධජ **'ෂ'** යෙදුණු වචන 10ක් සොයා ඉදිරිපත් කරන්න.
3 කණ්ඩායම - මූර්ධජ **'ණ'** යෙදුණු වචන 10ක් සොයා ඉදිරිපත් කරන්න.
4 කණ්ඩායම - මූර්ධජ **'ළ'** යෙදුණු වචන 10ක් සොයා ඉදිරිපත් කරන්න.
5 කණ්ඩායම - **'සඤ්ඤක'** අක්ෂර යෙදුණු වචන 10ක් සොයා ඉදිරිපත් කරන්න.
6 කණ්ඩායම - **'මහාප්‍රාණ'** අක්ෂර යෙදුණු වචන 10ක් සොයා ඉදිරිපත් කරන්න.

පහත දැක්වෙන ආකාරයේ වගුවක් ඔබේ අභ්‍යාස පොතේ අඳින්න. සියලු කණ්ඩායම්වලින් ඉදිරිපත් වූ වචන එම වගුවෙහි සටහන් කරන්න.

| තාලුජ 'ශ' යෙදුණු වචන | මූර්ධජ 'ෂ' යෙදුණු වචන | මූර්ධජ 'ණ' යෙදුණු වචන | මූර්ධජ 'ළ' යෙදුණු වචන | **'සඤ්ඤක'** අක්ෂර යෙදුණු වචන | **'මහාප්‍රාණ'** අක්ෂර යෙදුණු වචන |
|---|---|---|---|---|---|
| | | | | | |

## ක්‍රියාකාරකම 05

### නිත්‍ය බහුවචන

**පහත සඳහන් වාක්‍යවල තද කළු අකුරෙන් ඇති වචන දෙස අවධානය යොමු කරන්න.**

- මේ වන විට තම ජනතාවගේ ශෝකජනක තත්ත්වය පාලක පක්ෂයට ඉදිරිපත් කිරීමට එඩිතර සිතක් ඇති **අයෙක්** නො වූහ.
- මෙතුමාගේ මෙම ආදර්ශය හේතුවෙන් විදේශ නම් වෙනුවට සිංහල නම් භාවිතයට **සමහරෙක්** යොමු වූහ.

මෙහි සඳහන් **අයෙක්, සමහරෙක්** යන පද හඳුන්වන්නේ නිත්‍ය බහුවචන ලෙස ය. මෙවැනි නිත්‍ය බහුවචන පදයක් වාක්‍යයක උක්තය වශයෙන් යෙදෙන විට ආඛ්‍යාතය බහුවචනයෙන් තැබිය යුතු ය.

**අයෙක්** - **නො වූහ**
**සමහරෙක්** - **යොමු වූහ**

**ඇතැමෙක්, කෙනෙක්, කිසිවෙක්, යමෙක්, කවුරු** යන පද ද සිංහල භාෂාවේ ඇති නිත්‍ය බහුවචන ලෙස සැලකේ.

1. **පහත සඳහන් වැකිවල හිස්තැනට ගැළපෙන නිත්‍ය බහුවචන පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**

   (i) .......................................................... එකිනෙකාට සහයෝගය දක්වති.
   (ii) .......................................................... ඒ ගමනට සහභාගි වූහ.
   (iii) .......................................................... සතුටු සාමීචියේ යෙදී සිටිති.
   (iv) .......................................................... එදින වූ සිද්ධිය විස්තර කළහ.
   (v) .......................................................... ඒ දුගී මගී අසරණයන්ට පිහිටවත් ද?

2. **නිත්‍ය බහුවචන පද යොද වාක්‍ය පහක් ලියන්න.**